**තංගල්ල ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 04 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 24 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 30 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය
------

මෙම වාර්තාවේ **1.3.2, 1.3.3** හා **1.3.6** ඡේදවල දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට තංගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති අනාවරණය කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සැපයුම් හා උපකරණ ගිණුමේ ශේෂය, රු. 1,287,188 ක් හා ලැබියයුතු මුද්දර ගාස්තු රු.63,401,237 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ආ) සමුච්චිත අරමුදල් හා ඌණතා ගිණුමේ ආරම්භක ශේෂය රු.8,441,775 ක් අඩුවෙන් ද, අවසාන ශේෂය රු.4,460,000 ක් වැඩියෙන්ද, ණයහිමි ඌණතා වෙන්කිරීම ගැලපීමේදී රු.4,000,000 ක් වැඩියෙන්ද දැක්වුණි.

(ඇ) බැංකු ගිණුම් දෙකක ආරම්භක ශේෂ රු.669,367 ක් හා පොදු බැංකු ගිණුමේ ශේෂය රු. 6,919,180 ක් අඩුවෙන් ශේෂපත්‍රයේ දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂ දෙකට ලැබියයුතු එකතුව රු. 1,815,607 ක් වූ හිඟ වැටුප් සහ භූම්මාන මධ්‍යස්ථානයට අදාළ රු. 452,150 ක ආදායම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) 2015 ජූලි 16 දින පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු. 300,000 ක් වූ වාඩිගල ඉඩමෙහි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඊ) ගොඩනැගිලි ඉදිකිරීමට සහ යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීමට දරන ලද එකතුව රු. 4,845,519 ක් වූ වියදම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(උ) ඉකුත් වසර වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු කර්මාන්ත ආධාර රු. 4,294,654 ක් වැඩියෙන් දක්වා තිබුණු අතර, කර්මාන්ත දෙකකට අදාළව ලැබිය යුතු එකතුව රු. 1,851,380 ක මුදල වර්ෂයේ ආදායමින් සහ ණයගැති ශේෂයෙන් අත්හැරී තිබුණි.

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 03 ක ශේෂයන් සහ ඊට අදාළ පොත්පත් හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර, එකතුව රු. 15,067,655 ක අසමානතා නිරීක්ෂණය විය.

### 1.3.4 ලැබිය යුතු ගිණුම්

-------------------

ඉකුත් වර්ෂවලට අදාළ එකතුව රු. 713,658 ක් වූ ව්‍යාපාර බදු හා පොළ බදු ආදායම් සමාලෝචිත වර්ෂයේදීද අයකර ගෙන නොතිබුණි.

### 1.3.5 ගෙවිය යුතු ගිණුම්

---------------------

ඉකුත් වර්ෂයට අදාළව ඉටුකරන ලද කර්මාන්ත සඳහා ගෙවිය යුතු එකතුව රු. 11,354,177 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි.

### 1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

එකතුව රු.91,159,469 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් උපලේඛනය, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය හා සමීක්ෂණ වාර්තාද, එකතුව රු.3,753,090 ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, එකතුව රු.79,381,293 ක් වූ මෝටර් රථ හා කරත්ත, එකතුව රු.5,282,007 ක් වූ ලී බඩු හා සවි කිරීම් සහ එකතුව රු.216,195 ක් වූ විදුලිය ගබඩා සම්බන්ධයෙන් උපලේඛන සහ යාවත්කාලීන කරන ලද ලේඛනද, එකතුව රු.38,482,462 ක් වූ ණයගැති ශේෂ සහ එකතුව රු.3,966,981 ක් වූ ණයහිමි ශේෂ සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛනද, එකතුව රු.354,500 ක් වූ සභාවේ තැන්පත් සහ එකතුව රු.419,521 ක් වූ වීථි පහන් ණයගැති ශේෂ සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ, උපලේඛන සහ උපයෝගී ලේඛනද ඉදිරිපත් නොකෙරුණු බැවින් විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත විස්තර දැක්වෙන නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2015 මැයි 21 දිනැති අංක 15/ විවිධ (051) දරන අමාත්‍ය මණ්ඩල තීරණය | යොමුගත අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූල නොවී පළාත් පාලන ක්‍රීඩා උත්සවය වෙනුවෙන් සභා අරමුදලින් රු. 166,450 ක වියදම් දරා තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571(3) | කල් ඉකුත් වූ එකතුව රු. 1,030,706 ක තැන්පතු ශේෂ 317 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2015 ඔක්තෝබර් 09 දිනැති අංක PFD/RED/2015/08 පොදු (i) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ 4.3 (අ) ඡේදය | සභාවේ සේවයේ සිට ස්ථාන මාරු වී ගිය සේවකයින් පස්දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 323,600 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 10,335,236 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 30,067,942 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 19,732,706 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

**2.2** **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන වියදම මුළු පුනරාවර්තන ආදායමෙන් සියයට 83 ක් ඉක්ම වූ ප්‍රතිශතයක් ගෙන තිබුණු අතර, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන ආදායමෙහි රු. 12,459,935 ක අඩුවීමක් සහ මුළු පුනරාවර්තන වියදමෙහි රු. 7,272,772 ක වැඩිවීමක්ද දක්නට ලැබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සභාවේ ස්වයං උත්පාදන ආදායම් වල රු. 24,779,320 ක අඩුවීමක් පෙන්නුම් කෙරුණු අතර, සභාවේ පුනරාවර්තන වියදම් අඛණ්ඩව වැඩි වන වේගයකින් සැලකිය යුතු අගයයන්ගෙන් වැඩි වී තිබුණි.

(ඇ) ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ආදායම් වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමේ හැකියාවක් නොමැති බව පෙන්නුම් කෙරෙන අතර, ඒ සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කර, ක්‍රියාත්මක කළයුතු බවත් නිරීක්ෂණය විය.

**2.3** **ආදායම් පරිපාලනය**

**2.3.1** **වරිපනම් බදු**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු අයකළ හැකි දේපල හඳුනාගෙන තක්සේරුකර බදු අයකිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

**2.3.2** **අක්කර බදු**

සමාලෝචිත වර්ෂය ආරම්භයට, එකතුව රු. 127,075 ක් වූ හිඟ අක්කර බදු ශේෂයෙන් සියයට 8 ක් තරම් අඩු අගයක් අයකර ගෙන තිබුණි. හිඟ ආදායම් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.3.3** **බදු කුලී**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ)** **කඩ කාමර බදු**

(i) කඩකාමර 68 කින් 2015 දෙසැම්බර් 31 දිනට රු. 1,128,340 ක කුලී අයවීමට තිබුණු නමුත්, එකී හිඟ ශේෂ අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ii) 2011 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක අංක දපපා/පපාකො/2010/01 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 05 ඡේදය අනුව කඩකාමර 24 ක ගිවිසුම් වසර 03 කට වරක් යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) **පොළ බදු**

----------

යාවත්කාලීනව පොළ බදු අයකර නොගැනීම නිසා 2015 දෙසැම්බර් 31 දිනට රු. 760,830 ක් වූ හිඟ ආදායම් පැවති අතර, ඊට ඇතුළත් රු. 672,709 ක ශේෂ ඉකුත් වර්ෂ වලට අදාළ ඒවා විය.

**2.3.5 වෙළඳ බලපත්‍ර ගාස්තු**

**----------------------**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 149, 150, 151 හා 152 යන වගන්ති ප්‍රකාරව සභාව විසින් නියමිත පරිදි වෙළඳ බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර බදු අයකර නොගැනීම නිසා 2015 දෙසැම්බර් 31 දිනට රු. 31,860 ක වෙළඳ බලපත්‍ර ගාස්තු සහ රු. 149,020 ක ව්‍යාපාර බදු හිඟ ශේෂ පැවතුණි.

**2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**-----------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු. 752,302 ක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 22,905,198 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**3.1 කාර්යසාධන ඇගයීම**

**----------------------**

**ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන - 2015**

**-------------------------------------------------------------**

සභාව විසින් 2015 ජූලි සිට දෙසැම්බර් මස දක්වා ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති සකස් කර තිබූ නමුත්, 2015 නොවැම්බර් වන විටත් ජූලි මාසය සඳහා ලබාදී තිබූ රු. මිලියනයක මුදලින් රු. 191,602 ක් පමණක් වියදම් දැරීම නිසා ඉතිරි මාස 5 ට අදාළව ලබාගත හැකිව තිබූ රු. මිලියන 5 ක මුදල සභාවට අහිමි වී තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තියට හා 2014 ජූලි 4 දිනැති ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහය සඳහා වූ අංක 28 දරන අතිරේකයට අනුකූල නොවී මිල ගණන් 3 ක් පමණක් ලබා ගෙන අවස්ථා 03 කදී එකතුව රු. 2,318,950 ක් වටිනා භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) තැන්පත් ලේඛනයේ මුදල් රඳවා තබාගැනීම**

---------------------------------------------

2013 වර්ෂයේදී, ආයතන දෙකකින් ලැබී තිබුණු රු. 162,000 ක මුදලක් අදාළ කාර්යයන් සඳහා නොයොදා තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**(ආ) දකුණු පළාත් සභා සංවර්ධන සැලැස්ම**

---------------------------------------

දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2014 සඳහා මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ පෙර පාසල් සඳහා උපකරණ මිලදී ගැනීමට ලබාදී තිබුණු රු. 50,000 ක මුදලින් පෙර පාසල් ළමුන්ගේ ඡායාරූප ලබා ගැනීමට රු. 49,500 ක් වැය කර තිබුණි.

**3.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

-----------------------------

සභාවේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් තනතුරු 04 ක පුරප්පාඩු 06 ක් හා තනතුරු 08 ක අතිරික්ත 36 දෙනෙකු සිටින බව නිරීක්ෂණය වූ අතර, පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.5 බලය නොලත් ගනුදෙනු**

---------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඔ) වගන්තියට අනුකූල නොවී අමාත්‍යවරයාගේ ලිඛිත පූර්ව අනුමැතිය ලබා නොගෙන සභා අරමුදලින් රු. 3,353,062 ක වියදම් දරා භාණ්ඩ මිලදී ගෙන ස්වේච්ඡා සංවිධාන 13 ක් වෙත ලබා දී තිබුණි.

(ආ) දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව විශ්‍රාමික රජයේ නිලධාරියෙකු නැවත සේවයේ යොදවා ගෙන මාස 12 ක් සඳහා රු. 180,000 ක දීමනා සහා අරමුදලින් ගෙවා තිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

--------------------------------------

**4.1 අයවැය පාලනය**

------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 20 ක් සඳහා සලසා තිබුණු රු.852,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදන ඉතිරි කිරීමද, තවත් වියදම් විෂයයන් 03 ක එකතුව රු.5,822,943 ක් වූ ඉතිරි කිරීමද, වෙනත් වියදම් විෂයයන් 03ක ප්‍රතිපාදන සීමාව ඉක්මවා රු.42,354,151 ක වියදම්ද පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදවාගෙන නොතිබුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

----------------------

2014 පෙබරවාරි 24 දිනැතිඅංක දපපා/යහ/01/න.ච.ලේ. දරන දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාර අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

-----------------------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

**4.4 වත්කම් කළමනාකරණය**

----------------------------

සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මගින් භාණ්ඩ වර්ග 52 කට අයත් ඒකක 230 ක ඌනතාවයන් අනාවරණය කරගෙන තිබුණු නමුත්, ඒ සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**4.5 බේරුම් නොකළ බැරකම්**

----------------------------

2015 දෙසැම්බර් 31 දිනට සභාවේ බේරුම් නොකළ බැරකම්වල මුළු එකතුව රු. 15,458,618 ක් වූ අතර, ඉන් රු. 11,354,177 ක් ඉකුත් වර්ෂයට හා රු.505,978 ක් 2013 වර්ෂයටත් පෙර වර්ෂ වලට අයත් ඒවා විය. එකී ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලන**

**--------------------**

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) මූල්‍ය පාලනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) වත්කම් කළමනාකරණය
(ඊ) කාර්ය මණ්ඩල පරිපාලනය
(උ) වාහන පාලනය